AL/2019/44/S-I(OLD)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.05 / 0830 - 1030

ඉස්ලාම් I
இஸ்லாம் I
Islam I

44 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පසුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** හෝ පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

1. අස්මා උල් හුස්නාහි එකක් වන 'අස්සලාම්' යන්නෙහි අර්ථය වන්නේ,
   (1) කරුණාවන්තයා ය.
   (2) ශාන්තිය ලබා දෙන්නා ය.
   (3) අතිශය කමාකරන්නා ය.
   (4) පෝෂකයා ය.
   (5) අතිශය පාරිශුද්ධ වූ අයෙක් ය.

2. ආධ්‍යාත්මික ප්‍රවර්ධනය සඳහා වූ මාර්ගවලින් එකක් වන 'වරඋ' යන අරාබි පදය හඟවන අර්ථය වන්නේ,
   (1) වැළකීම ය.
   (2) දේව බිය ය.
   (3) තණ්හාවෙන් තොර ජීවිතය ය.
   (4) දිව්‍යමය සෙනෙහස ය.
   (5) දෙවියන්ගේ තෘප්තිය ය.

3. නබිතුමාගේ සහාබාවරුන් ප්‍රථම වතාවට හිජ්රත් ගිය ස්ථානය,
   (1) තායිෆ් ය. (2) හබසා ය. (3) මදීනා ය. (4) ෂාම් ය. (5) යෙමනය ය.

4. ෂිර්ක් හපියට නිදසුනක් වන්නේ,
   (1) අල්ලාහ් නොවන දෙයක් වැඳීම ය.
   (2) ජින්වරුන් වැඳීම ය.
   (3) හූනියම් කිරීම ය.
   (4) නීති සම්පාදන බලය තවකෙනෙකුට පැවරීම ය.
   (5) අල්ලාහ් නොවන කෙනෙකුට බිලිදීම ය.

5. හිජ්රාත්වලින් පසුව නබි(සල්) තුමා මුලින්ම නිර්මාණය කරන ලද පල්ලිය,
   (1) මස්ජිදුන් නබවි ය.
   (2) මස්ජිදුන් නමිරා ය.
   (3) මස්ජිදුල් හරාම් ය.
   (4) මස්ජිදුල් කුබා ය.
   (5) මස්ජිදුල් කිබ්ලතෛන් ය.

6. එළුවන් සියයක් සතු පුද්ගලයකු විසින් zසකාත් වශයෙන් දියු යුතු එළුවන් සංඛ්‍යාව,
   (1) එකකි.
   (2) දෙකකි.
   (3) තුනකි.
   (4) හතරකි.
   (5) පහකි.

7. 'ෆර්ලු කිෆායා' වලට නිදසුනක් වන්නේ,
   (1) පස්වේල් සලාතය ය.
   (2) උපවාසය ය.
   (3) දෙමව්පියන් බලා ගැනීම ය.
   (4) සමාජ සහ ජාතික සුභසාධනයෙහි සහභාගිත්වය ය.
   (5) දරුවන් නඩත්තු කිරීම ය.

8. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපන අභිවෘද්ධියට සහය වූ විදේශීය ආගන්තුකයා,
   (1) ඉබ්නු බතූතා ය.
   (2) කාලිද් ඉබ්නු බකායා ය.
   (3) ඔරාබි පාෂා ය.
   (4) වහබ් ඉබ්නු අබීහෆ්සා ය.
   (5) අයි. ඩබ්. ෆාල්ක් ය.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

9. ශ්‍රී ලංකාවේ සිට හජ් වන්දනාව සඳහා යන්නන් ඉහ්රාම් සඳහා නියියත් අධිෂ්ඨානය කළ යුතු ස්ථානය
(1) අල් ජුහ්ෆා ය. (2) zසාතුල් ඉරාක් ය. (3) කර්නුල් මනාසිල් ය.
(4) zසුල්හුලෛෆා ය. (5) යලම්ලම් ය.

10. නබි(සල්) තුමාගේ මක්කා සමයේ දඃවාවේ සිදු වූ ඉස්ලාම්හි මූලික ඉගැන්වීම අඩංගු පිළිතුර තෝරන්න.
(1) තව්හීද්, රිසාලත්, මආද් (2) කිලාෆත්, රිසාලත්, ඉබාදත්
(3) රිසාලත්, මුආමලත්, හිදායත් (4) රිසාලත්, ඉබාදත්, වරාසත්
(5) ජිනායත්, ඉබාදත්, මආද්

11. හදීස් සහ ඉස්ලාම් නීති විද්‍යාව යන ක්ෂේත්‍රයන් දෙකටම දායක වූ ඉමාම්වරු වූයේ,
(1) ඉමාම් ෂුයුති සහ ඉමාම් නවවි (රහ්) ය.
(2) ඉමාම් තිර්මිදි සහ ඉමාම් නසඊ (රහ්) ය.
(3) ඉමාම් ඉබ්නු මාජා සහ ඉමාම් රාෆිඊ (රහ්) ය.
(4) ඉමාම් මාලික් සහ ඉමාම් අහ්මදු (රහ්) ය.
(5) ඉමාම් අබූයූසුෆ් සහ ඉමාම් බෛහකි (රහ්) ය.

12. ඉස්නාද් සහාබි දක්වා යන හදීස් වන්නේ,
(1) මව්කූෆ් ය. (2) මර්ෆූඃ ය. (3) මුර්සල් ය. (4) මක්තුඃ ය. (5) මව්ලූඃ ය.

13. යමාමා යුද්ධයේ දී නබිතුමාගේ සහාබාවරුන් ජීවිතක්ෂයට පත්වීමෙන් පසු අල්-කුර්ආනය එකලස් කළ යුතු යැයි උපදෙස් දුන් සහාබිවරයා,
(1) අබූ බක්කර් (රළි) ය. (2) උමර් (රළි) ය. (3) උස්මාන් (රළි) ය.
(4) මුආවියා (රළි) ය. (5) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) ය.

14. zසකාත් ලබා ගැනීමට සුදුස්සන් අතුරෙන් 'අර්රිකාබ්' ලෙස හැඳින්වෙන්නේ,
(1) ණය බරින් පෙළෙන්නන් ය. (2) මගීන් ය.
(3) දුප්පතුන් ය. (4) ඉස්ලාමය අලුතින් වැළඳගත් තැනැත්තන් ය.
(5) වහලුන් ය.

15. ඉස්ලාම් අනුමත කර ඇති වෙළඳාම් ක්‍රමයෙහි 'සමූහ ව්‍යාපාරය' හඳුන්වන පදය,
(1) ඉආරා ය. (2) ඉජාරා ය. (3) මුෂාරකා ය. (4) සලම් ය. (5) මුසාරආ ය.

16. ඉස්ලාම් ආගම ආහාර සඟවා තැබීම තහනම් කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?
(1) ආහාර ද්‍රව්‍ය නරක් වීම (2) ආහාර ද්‍රව්‍යවල මිල අධික වීම
(3) මහජනතාවට එයින් බලපෑම් ඇති වීම (4) නිෂ්පාදකයන්ට පාඩු සිදු වීම
(5) ආහාර ද්‍රව්‍ය දීර්ඝ කාලයක් රැස්කර තැබීම අපහසු වීම

17. ඉස්ලාම් වෙළෙඳ ක්‍රමයෙහි 'රහ්න්' පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) දෙදෙනෙක් නිශ්චිත මුදලක් ආයෝජනය කොට වෙළෙඳාමෙහි යෙදීම ය.
(2) එක් පාර්ශ්වයක ප්‍රාග්ධනය සහ තවත් පාර්ශ්වයක ශ්‍රමය ව්‍යාපාරයෙහි යෙදීම ය.
(3) යම්කිසි භාණ්ඩයක් සීමිත කාලයකට ණයට ලබා දීම ය.
(4) අස්වැන්නෙන් සමාන කොටසක් ලබා ගැනීමේ පදනමින් කෘෂිකාර්මික ඉඩමක් ලබා දීම ය.
(5) කිසියම් මුදල් ප්‍රමාණයක් ලබාගැනීමට යම් දෙයක් උකසට තැබීම ය.

18. කුලෆා උර්රාෂිදීන් පිළිබඳ කරුණු කිහිපයක් පහත දැක්වේ.
A - තුන්වන කලීෆා
B - මුසයිලමාට විරුද්ධව යුද්ධ කළ පුද්ගලයා
C - හිජ්රත්හිදී නබි (සල්) සමග මදීනාවට ගිය පුද්ගලයා
D - නාවික හමුදාව හඳුන්වා දුන් පුද්ගලයා
E - හිජ්රි දින දර්ශනය හඳුන්වා දුන් පුද්ගලයා
F - හුදෛයිබියියා සම්මුතියේ දී සාම සාකච්ඡාව සඳහා කුරෛෂිවරුන් වෙත යැවූ පුද්ගලයා

ඉහත සඳහන් කරුණු අතුරෙන් කලීෆා උස්මාන් (රළි) තුමා සම්බන්ධ කරුණු ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B සහ C (2) A, D සහ F (3) B, C සහ D
(4) C, E සහ F (5) D, E සහ F



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

0558

19. ප්‍රවේණි උරුමය පිළිබඳ නීතියෙහි 'අසබා' යන්නෙන් අදහස් වන තැනැත්තන්
(1) අල්-කුර්ආන්, සුන්නාහි සඳහන් නිර්ණායක අනුව පංගුව ලබන උරුමක්කරුවන් ය.
(2) පිය පාර්ශ්වයට ආසන්න ඥාතීන් ය.
(3) අල්-කුර්ආන්, සුන්නා අනුව මරණයට පත් වූ තැනැත්තාගේ පංගු නිර්ණය නොවූ ආසන්න පිරිමි උරුමකරුවන් ය.
(4) නිශ්චිත උරුමක්කරුවන් නොමැතිවිට උරුමය ලබන්නන් ය.
(5) මියගිය පුද්ගලයාගේ ආසන්න ඥාතීන් කිසිවෙකුත් නොමැති විට උරුමය ලබන දුරස්ථ ඥාතීන් ය.

20. දික්කසාද ක්‍රමවලින් එකක් වූ "කුල්උ" යනු,
(1) බිරිද කිසියම් මුදල් ප්‍රමාණයක් හෝ වටිනා දෙයක් ලබා දී ස්වාමිපුරුෂයාගෙන් දික්කසාදය ලබා ගැනීම ය.
(2) ස්වාමි පුරුෂයා, භාර්යාවට පරපුරුෂ සේවන චෝදනාවක් සිදු කර දික්කසාද වීම ය.
(3) දිවුරුම් දීමෙන් පසුව සිදු වන දික්කසාදය වේ.
(4) තලාක් රජ්ඊවලින් පසුව සිදු වන දික්කසාදය වේ.
(5) භාර්යාව මවට සමාන කිරීම මගින් ඇති වන දික්කසාදය වේ.

21. මරණයට පත් වූ පුද්ගලයාගේ දේපළ බෙදීම සම්බන්ධව නීති රීති ඇතුළත් විද්‍යාව වන්නේ,
(1) ඉල්මුල් අකීදා ය.
(2) ඉල්මුල් ෆික්හ් ය.
(3) ඉල්මුල් බලාගා ය.
(4) ඉල්මුල් ජරහ්වත්තඃදිල් ය.
(5) ඉල්මුල් මීරාස් ය.

22. ශුද්ධ වූ රාමලාන් මාසයේ උපවාසය රැකීමට ශක්තිය නොමැති වයෝවෘද්ධ තැනැත්තා
(1) තව්බා සිදු කළ යුතුයි.
(2) ෆිත්රා ලබා දිය යුතුයි.
(3) දුගියන් හැට දෙනෙකුට ආහාර ලබා දිය යුතුයි.
(4) උපවාසය පසුවට කල් තැබිය යුතුයි.
(5) කෆ්ෆාරා දිය යුතුයි.

23. උසුලුත් තෆ්සීර් ක්ෂේත්‍රයට දායක වූ පුරෝගාමියකු වන්නේ,
(1) ඉමාම් සමඛ්ෂරි ය.
(2) ඉමාම් රාසි ය.
(3) ඉමාම් සුයූති ය.
(4) ඉමාම් තන්තාවි ය.
(5) ඉමාම් ඉබ්නු ජරීර් අත්තබරි ය.

24. යම් උරුමයක් තවත් අය නිසා අඩුවෙන් ලැබීම
(1) හජබ් වේ.
(2) හජබ් නුක්සාන් වේ.
(3) හජබුල් හිර්මාන් වේ.
(4) අසබා වේ.
(5) zසවුල් අර්හාම් වේ.

25. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.
A - මුනාෆික්වරුන්ගේ ගතිගුණ ගැන පැහැදිලි කරන වාක්‍යය
B - දීර්ඝ වාක්‍යය හා දීර්ඝ පරිච්ඡේද
C - පෙර වේදයන් පිළිබඳ වූ සත්‍යතාවය පැහැදිලි කරන වාක්‍යය
D - ආකර්ෂණීය වාක්‍යය සහ කුඩා ආයත්
E - මිනිසාණෙනි, යනුවෙන් කියැවෙන වාක්‍යයක්
ඉහත ප්‍රකාශ අතුරෙන් මදනි සූරාවලට සම්බන්ධ වූ පිළිතුර තෝරන්න.
(1) A, B සහ C
(2) A, C සහ D
(3) A, D සහ F
(4) B, C සහ E
(5) C, D සහ E

26. යම් අයෙකු සතුව රු. 1,000 000 ක මුදලක් ඇත. ඔහු ලබා දිය යුතු ණය රු. 200 000 වේ. නිශ්චිත අවුරුද්දේ දිය යුතු zසකාතයෙහි නිසාබ් රු. 700 000 නම් ඔහු වසර අවසානයේ දිය යුතු zසකාත් ප්‍රමාණය කොපමණ ද?
(1) රු. 5 000
(2) රු. 10 000
(3) රු. 15 000
(4) රු. 20 000
(5) රු. 25 000

27. මුස්ලිම්වරයකු හලාල් ආහාර අනුභව කිරීමට හේතු මොනවා ද?
(1) ශාරීරික සහ මානසික සෞඛ්‍යයට යෝග්‍ය වීම ය.
(2) ශාරීරික වර්ධනයට අවශ්‍ය වීම ය.
(3) ෂරීආවෙන් නිර්දේශ කර තිබීම ය.
(4) පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න ආහාර වීම ය.
(5) ශක්තිය හා රසය සහිත වීම ය.



Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

**28.** 'මුඅව්විතතයින්' ලෙස හැඳින්වෙන සූරා,
(1) සූරා යාසීන් සහ සූරා බකරා ය.
(2) සූරා නාස් සහ සූරා ෆලක් ය.
(3) සූරා බකරා සහ සූරා ආල ඉම්රාන් ය.
(4) සූරා කහ්ෆු සහ සූරා මුසම්මිල් ය.
(5) සූරා ෆාතිහා සහ සූරා බකරා ය.

**29.** "තරුණයිනි, ඔබ අතුරෙන් පොහොසත් ඇති අය විවාහ වන්න. මක් නිසාද යත්, එය බැලීම පාලනය කරගැනීමටත්, පතිවත රැකගැනීමටත් වේ. පහසුකම් නැති අය උපවාසය සිදු කිරීම ඔවුන්ට ආරක්ෂාවක් ලබා දේ" යන්න
(1) අල්-කුර්ආන්යේ ප්‍රකාශයකි.
(2) සහාබිවරයෙකුගේ ප්‍රකාශයකි.
(3) නබි (සල්) තුමාගේ ප්‍රකාශයකි.
(4) ඉමාම්වරයෙකුගේ ප්‍රකාශයකි.
(5) සූෆිවරයෙකුගේ ප්‍රකාශයකි.

**30.** පහත කරුණු අතුරෙන් සලාතය මගින් පුද්ගලයෙකුට ලැබෙන ආධ්‍යාත්මික ප්‍රයෝජනයක් වනුයේ,
(1) දෙවියන්ගේ ආශිර්වාදය ලැබීම ය.
(2) ශරීරය සහ ඇඳුම්වල පිරිසිදු බව ය.
(3) සෞඛ්‍ය සම්පන්නව ජීවත් වීම ය.
(4) කාල කළමනාකරණ පුහුණුව ලැබීම ය.
(5) නායකත්වයට ගරු කිරීමට පුහුණු වීම ය.

**31.** කුර්ආන් කලාවන් හා සම්බන්ධ වූ 'මුතෂාබිහාත්' යන්න පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) අර්ථ පැහැදිලි වූ අල්-කුර්ආන් වාක්‍යය ය.
(2) අර්ථ කිහිපයක් සහිත අල්-කුර්ආන් වාක්‍යය ය.
(3) නීතිය වෙනස් කළ අල්-කුර්ආන් වාක්‍යය ය.
(4) සූරා ආරම්භයේ ඇති තනි අක්ෂර ය.
(5) අකීදා සම්බන්ධ වූ අල්-කුර්ආන් වාක්‍යය ය.

**32.** මහාවංශයෙහි සඳහන් වන 'යෝනක' යන පදයෙන් අරාබි ජනයා අදහස් කෙරෙන බව ප්‍රකාශ කළ මහාවංශ භාෂා පරිවර්තකයා,
(1) ඇලෙක්සැන්ඩර් ජොන්ස්ටන් ය.
(2) ආචාර්ය බාලේන්ද්‍රා ය.
(3) විලියම් මූර් ය.
(4) විලියම් හයිගර් ය.
(5) චීන සංචාරකයා වූ ෆාහියන් ය.

**33.** දෙවියන්ගේ මඟ පෙන්වීමක් මත වේදය සහ සුහුෆු ලබා ගත් දේව දූතයා,
(1) මූසා (අලෛ) ය.
(2) ඊසා (අලෛ) ය.
(3) දාවූද් (අලෛ) ය.
(4) ඉබ්රාහිම් (අලෛ) ය.
(5) නූහ් (අලෛ) ය.

**34.** පහත ප්‍රකාශ අතුරෙන් ෂරීආ පදනමින් වරදට දඬුවම් දීමේ දී සැලකිය යුතු කරුණු සම්බන්ධයෙන් **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,
(1) දඬුවම සුදුසුව තිබීම ය.
(2) දඬුවම නීතිමය වීම ය.
(3) දඬුවම වැරදි අනුව වෙනස් වීම ය.
(4) දඬුවම් දීමේ දී වැරදිකරුගේ තරාතිරම, පදවිය වැනි දේ සැලකිල්ලට ගැනීම ය.
(5) දඬුවම සමාජ ආරක්ෂාව ඉලක්ක කර තිබීම ය.

**35.** නබිවරුන් අතර **නොතිබිය** යුතු ගුණාංග වන්නේ,
(1) කියානත්, කිත්බු, කිත්මාන් සහ ෆතානත් ය.
(2) තබ්ලීක්,, බලාදත්, කියානත් සහ කිත්බු ය.
(3) කිත්මාන්, කිත්බු, කියානත් සහ සිද්කු ය.
(4) බලාදත්, කියානත්, කිත්බු සහ ෆතානත් ය.
(5) බලාදත්, කියානත්, කිත්බු සහ කිත්මාන් ය.

**36.** 'අය්යාමුත් තෂ්රික්' යනු,
(1) මුහර්රම් මාසයේ 9, 10 සහ 11 චන්ද්‍ර දින වේ.
(2) ෂඃබාන් මාසයේ 11, 12 සහ 13 චන්ද්‍ර දින වේ.
(3) දුල්හජ් මාසයේ 11, 12 සහ 13 චන්ද්‍ර දින වේ.
(4) රබිඋල් අව්වල් මාසයේ 13, 14 සහ 15 චන්ද්‍ර දින වේ.
(5) රජබ් මාසයේ 28, 29 සහ 30 චන්ද්‍ර දින වේ.

**37.** ඉමාම් බුහාරි (රහ්) තුමාගේ ගුරුවරු අතුරෙන් අයෙකු වන්නේ,
(1) ඉමාම් අබුදාවුද් (රහ්) ය.
(2) ඉමාම් අහ්මදු ඉබ්නු හන්බල් (රහ්) ය.
(3) ඉමාම් නසාඊ (රහ්) ය.
(4) මුහම්මදු ඉබ්නු අහ්මදු මරූසි (රහ්) ය.
(5) ඉමාම් තබරානි (රහ්) ය.

[පස්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● අංක **38** සිට **41** දක්වා වූ සෑම ප්‍රශ්නයකට ම **X** සහ **Y** යන තීරු යටතේ දී ඇති තොරතුරු කිසියම් ක්‍රමයකින් එකිනෙක හා සැසඳේ. ඒ අනුව **X** තීරුවේ ඇති තොරතුරුවලට අදාළ ව **Y** තීරුවේ ඇති තොරතුරු පෙළගස්වා ඇති නිවැරදි වරණය තෝරන්න.

**38.**

| X | Y |
|---|---|
| (i) ඉමාම් ෂාෆිඊ (රහ්) | A - මුඅත්තා |
| (ii) ඉමාම් අබූහනීෆා (රහ්) | B - මුස්නත් |
| (iii) ඉමාම් මාලික් (රහ්) | C - ෆික්හුල් අක්බර් |
| (iv) ඉමාම් අහ්මද් (රහ්) | D - අල්-උම්මු |

(1) A B C D (2) B C D A (3) C B A D (4) D B A C (5) D C A B

**39.**

| X | Y |
|---|---|
| (i) තව්බා | A - දිව්‍යමය සෙනෙහස |
| (ii) රිලා | B - සිතේ පාරිශුද්ධභාවය |
| (iii) ඉඛ්ලාස් | C - දේව තෘප්තිය |
| (iv) මහබ්බත් | D - පව් කමාව අයැදීම |

(1) A D C B (2) B C A D (3) B D C A (4) D A B C (5) D C B A

**40.**

| X | Y |
|---|---|
| (i) වලි | A - සාක්ෂිකරු |
| (ii) ෂාහිද් | B - ආරක්ෂකයා |
| (iii) මහර් | C - විවාහයක දී මනමාලයා දෙන භෝජන සංග්‍රහයක් |
| (iv) වලීමා | D - විවාහයක දී මනමාලියට මනමාලයා දෙන ත්‍යාගය |

(1) A C B D (2) B A D C (3) B C A D (4) C D A B (5) D A C B

**41.**

| X | Y |
|---|---|
| (i) කිලාෆත් | A - අද්භූතජනක දේ |
| (ii) ඉබාදත් | B - භූමිය සශ්‍රීක කිරීම |
| (iii) මුඃජිසත් | C - නියෝජනය |
| (iv) ඉමාරත් | D - වන්දනා කිරීම |

(1) A C D B (2) A D B C (3) B D C A (4) C D A B (5) D B C A

**42.** 'සහීහා සාදිකා' යන හදීස් සංග්‍රහ කළ සහාබිවරයා,
(1) අබ්දුල්ලාහ් ඉබ්නු උමර් (රලි) ය. (2) අම්රු ඉබ්නුල් ආස් (රලි) ය.
(3) සෑදු ඉබ්නු අබිවක්කාස් (රලි) ය. (4) අනස් ඉබ්නු මාලික් (රහ්) ය.
(5) සුබෛර් ඉබ්නුල් අවාම් (රලි) ය.

**43.** ඉමාම් මුස්ලිම් (රහ්) ඉපදුන වර්ෂය,
(1) හි : 204 (2) හි : 205 (3) හි : 206 (4) හි : 207 (5) හි : 208

**44.** ඉස්ලාම්හි ප්‍රධාන යුතුකම් අතුරෙන් උම්රාහි සිදු **නොවන** කාර්යය වනුයේ,
(1) ඉහ්රාම් ය. (2) තවාෆ් ය. (3) සෑයු ය. (4) හල්ක් ය. (5) අරාෆාහි රැඳීම ය.



Department of Examinations Sri Lanka

- අංක **45** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ප්‍රකාශ දෙකක් බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි **අංකය** පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| වරණ අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | වැරදි ය. | නිවැරදි ය. |
| (3) | නිවැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | වැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමුවන ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| **45.** | වාසිල් ඉබ්නුල් අතා, ඉමාම් හසනුල් බස්රිගේ ගුරුවරයා වේ. | මුඃතසිලාවරු අල්-කුර්ආන් සහ සුන්නාහි අදහස්වලට මුල්තැන දෙති. |
| **46.** | පිරිමි අය රිදී මුදු පැළඳීමෙහි වරදක් නැත. | අනතුරක් කිරීමට පැමිණෙන සතුන් පවා ගින්නෙන් පිළිස්සීම ෂරීආ තහනම් කරයි. |
| **47.** | මුතවාතිර්වූ හදීස් විශ්වසනීය වේ. | හසන් මට්ටමේ ඇති හදීස් මූලාශ්‍ර ලෙස ගත නොහැකියි. |
| **48.** | ඉස්ලාම් ආර්ථික සංකල්ප දිව්‍යමය වේ. | කියාස් සහ සහභාවරුන්ගේ ඉජ්මා සමාන මට්ටමින් සැලකේ. |
| **49.** | ‘උර්ෆ්’ එක් නීති මූලාශ්‍රයක් ලෙස ගත නොහැකි ය. | හරාම්වලට මග පෙන්වන දේත් හරාම් වේ. |
| **50.** | මක්කාහි වෙළෙඳපොළ තත්ත්වයන් නිරීක්ෂණය කිරීම සඳහා සර්ද් ඉබ්නු සර්ද් අල් ආස් (රළි) තුමා පත් කර තිබුණි. | මදීනාවේ වෙළෙඳපොළ තත්ත්වයන් නිරීක්ෂණය කිරීම සඳහා උමර් (රළි) තුමා පත් කර තිබුණි. |

* * *

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

ඉස්ලාම් II
இஸ்லாம் II
Islam II

44 S II

2019. 08. 06 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **20** බැගින් හිමි වේ.

## I කොටස

1. පහත සඳහන් යුගල පද අතර පවතින වෙනස්කම් පෙන්වා දෙන්න.
   (i) ඊමාන් මුජ්මල් - ඊමාන් මුෆස්සල්
   (ii) මක්කි වාක්‍යයක් - මදනි වාක්‍යයක්
   (iii) මුතවාතිර් - ආහාද්
   (iv) අඛ්ලාක් - මුආමලාත්

2. (i) 'තක්වා' යන්න අර්ථ දක්වන්න.
   (ii) මුස්ලිම්වරයකුගේ ජීවිතයට තක්වා හි වැදගත්කම ගැන අල්-කුර්ආන් සහ සුන්නාවල සාක්ෂි පදනම් කරගෙන විස්තර කරන්න.
   (iii) මුස්ලිම්වරයකුගේ දෛනික ජීවිතයේ දී 'තක්වා' අනුගමනය කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **පහක්** සඳහන් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න.
   (iv) මුස්ලිම්වරයකුගේ ආධ්‍යාත්මික ජීවිතයට බාධාවන කරුණු **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

3. (i) ෆර්ලු අයින් සහ ෆර්ලු කිෆායා නිදසුන් සහිතව වෙන වෙනම පැහැදිලි කරන්න.
   (ii) ඉබාදාවල අරමුණු **පහක්** විස්තර කරන්න.
   (iii) මිනිස් ජීවිතයේ දී සියලු ක්‍රියා ඉබාදත් ලෙස සකස් වීමට අවශ්‍ය කොන්දේසි **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
   (iv) මුස්ලිම්වරයකු zසකාත් ඉටු කිරීමෙන් ලැබෙන සමාජ ප්‍රතිලාභ **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

## II කොටස

4. (i) ඉස්ලාම්, ජීවනෝපාය සඳහා ඉපයීම්වලට දී ඇති වැදගත්කම අල්-කුර්ආන් සහ සුන්නා සාක්ෂි පදනම් කරගෙන විස්තර කරන්න.
   (ii) මුස්ලිම්වරයකු අසල්වැසියා සමග පැවැත්විය යුතු සබඳතා ගැන ඉස්ලාම් ඉගැන්වීම් විවරණය කරන්න.

5. (i) "ඉජ්තිහාද්වල දොර වසනු ලැබීය." යන චින්තනය වර්ධනය වීමට තුඩුදුන් කරුණු පහදන්න.
   (ii) 'තක්ලීද්' චින්තනයෙන් ඉස්ලාමීය සමාජය තුළ ඇති වූ හානිදායක ප්‍රතිඵල විමසන්න.

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**6.** (i) ඉස්ලාමීය පවුල් ජීවිතයේ වැදගත්කම ගැන අල්-කුර්ආන් සහ හදීස් සාක්ෂි පදනම් කරගෙන පැහැදිලි කරන්න.

(ii) මුස්ලිම්වරයකු තම භාර්යාවට තලාක් කීමෙන් ඇති වන පවුල් හා සමාජීය හානිදායක බලපෑම් විවරණය කරන්න.

**7.** නබි(සල්) තුමාගේ සමයේ ඉස්ලාමීය සංවර්ධනයට පහත අංශ සිදු කළ දායකත්වය සාකච්ඡා කරන්න.

(අ) මස්ජිදුන් නබවි

(ආ) නබි(සල්) තුමා සිදු කළ ගිවිසුම්

**8.** පහත සඳහන් මාතෘකා ගැන පැහැදිලි කරන්න.

(i) මිනිස් ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිකෝණය

(ii) මුස්ලිම්වරු අනෙක් ප්‍රජාවන් සමග යහපත් සම්බන්ධතාවක් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka